# මිහිඳු මහරහතන් වහන්සේ සහ
# මිහිඳු මහසෑ වන්දනාව

අප භාග්‍යවතුන් වහන්සේ, දඹදිව ගයාවේ, නේරංජරා නදිය අසබඩ, ජයශ්‍රී මහා බෝ සෙවණේ, ශ්‍රී සම්බුද්ධත්වය සාක්ෂාත් කොට, උතුම් ධර්මචක්‍රය, මැනවින් ප්‍රවර්තනය කොට, සුවාසූ කෙළක් දෙව් මිනිසුන් හට, අමා මහනිවන් දක්වා, අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන්, පිරිනිවන් පෑමෙන්, දෙසිය තිස්හය වසක් ගත වූ තැන, අප භාග්‍යවතුන් වහන්සේගේ, උතුම් සම්බුදු සසුන, මුළු හදවතින් දරාගෙන, ඉට්ඨිය උත්තිය සම්බල, භද්දසාල යන තෙරුන් වහන්සේලා ද, සුමන සාමණේරයන් ද යන, ෂඩ් අභිඥාලාභී, රහතන් වහන්සේලා සමග, භණ්ඩුක නමැති, අනාගාමී උපාසක ද කැටුව, ලක්දිවට අනුබුදු කෙනෙකු බඳු වූ, දීපප්පසාදක වූ, ලක්වැසියන්ගේ ආදිගුරුදේවෝත්තම වූ, අපගේ මිහිඳු මහරහතන් වහන්සේ, පොසොන් පොහෝ දා, මේ මිස්සක පව්වට, ඉර්ධියෙන් වැඩම කළ සේක.

මෙහි වැඩම කොට, ලක්වැසි සියලු සත්වගට, අමා මහනිවන් දොර විවර කරවා, ලක්වැසි කුලපුතුන් පැවිදි උපසපන් කරවා, තුන් පිටකය වණපොත් කරවා, සර්වඥ ධාතුන් වහන්සේලා වඩමවා, ථූපාරාම සෑ බඳවා, ජය ශ්‍රී මහා බෝ දකුණු ශාඛා වහන්සේ, සඟමිත් තෙරණිය ලවා වැඩම කරවා, ලක්වැසි කුලාංගනාවන්ට ද, මෙහෙණ පැවිද්ද ලබාදී, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන, සිව්වණක් පිරිස මෙහි ඇතිකරවා, මේ ලංකාද්වීපය, ධර්මද්වීපයක් කරවා, සත්පුරුෂ කලණමිතුරන් ඇති කරවා, ශ්‍රී සද්ධර්මය නම් වූ අමා බෙර හසුරුවා, ගෞතම බුදු සසුන මැනවින් ඒකාලෝක කොට වදාළ, අපගේ මිහිඳු මහරහතන් වහන්සේ, අසූ වයස් පිරුණු කල්හි, වප් පුර අටවක් පොහෝ දා, අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන්, පිරිනිවන් පා වදාළ සේක. අපගේ ආදිගුරුදේවෝත්තම වූ, මිහිඳු මහරහතන් වහන්සේට නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා!

**යෝ සත්ථුකප්පෝ කල්‍යාණමිත්තෝ - මහාඤාණී ජිනත්‍රජෝ**
**සෝ ලංකාදීපමාගම්ම - ජෝතයී බුද්ධසාසනං**
**තං වීතරාගං ලංකාදීපප්පසාදකං - වන්දාමි පරිනිබ්බුත මහා මහින්දං**

1. මිස්සක පව්වේ - අඹතල වෙහෙරේ
මිහිඳු බුදුපුතුන් - වැඩඋන්නේ
ලක්වැසියන්ගේ - ගුරුදෙව්ඳාණන්
බුදුපුතා දකින්නට - අපි එන්නේ

2. ගෞතම මුනිඳුගෙ - ළයෙහි ජනිත වූ
නිකෙලෙස් ගුණ කඳ - දරමින්නේ
පොසොන් පොහෝ දා - මිස්සක පව්වට
බුදුපුතු අහසින් - වැඩමන්නේ

3. අනුරපුරේ මහ - නිරිඳා මෙහි විත්
දඩයම් යන්නට - සැරසෙන්නේ
මුවෙකුගෙ වේසෙන් - දෙවියෙක් ඇවිදින්
මිහිඳු තෙරුන් වෙත - කැඳවන්නේ

4. තිස්ස තිස්ස යන - නම අමතනවා
නිරිඳුන් වටපිට - විමසන්නේ
රන් රූ විලසින් - පැවිදි පිරිස විත්
රජු පෙරටුව මෙහි - වැඩ ඉන්නේ

5. මහරජ අපි හැම - ශ්‍රමණවරුන් වෙමු
සව්වෝ වෙමු අපි - දම්රජුගේ
තොප ගැන ඇති වූ - අනුකම්පාවෙන්
දඹදිව සිට මෙහි - අපි ආවේ

6. තිස්ස නිරිඳුගේ - සැක දුරුවන්නේ
අඹරුක් සෙවණේ - හිඳගන්නේ
අපගෙ මිහිඳු හිමි - බුදුබණ දෙසුමට
සුළු ඇත් උවමයි - අරගන්නේ

7. බුදුසසුනේ ඇති - අසිරිය වැටහී
සම්බුදු ගුණයන් - දැනගන්නේ
සේනා පිරිවර - සමගින් ලක්රජ
තුන් සරණය වෙත - පැමිණෙන්නේ

8. තිස්ස නිරිඳුගෙන් - ඇරයුමක් ලැබෙන්නේ
අනුරපුරයටත් - වැඩමන්නේ
අනුලා දේවිත් - ලක් අඟනුන් හා
බුදු බණ ඇසුමට - රිසි වන්නේ

9. අපගෙ මිහිඳු හිමි - දහම් දෙසනවා
දහමෙහි පදරුත් - වැටහෙනවා
පන්සියයක් ඒ - අඟනුන් සැම දෙන
මගඵල නිවනින් - සැනසෙනවා

10. විස්මිත බුදුගුණ - කියනා මුනිදෙක්
ලක්දිව වැඩි වග - පැතිරෙන්නේ
මල් රොන් සොයනා - බමර කැලක් සේ
පුරවැසියන් රොද - බැඳගන්නේ

11. ගෞතම මුනිඳුගෙ - සම්බුදු බණපද
අනුරපුරේ හැම - රැව් දෙන්නේ
ලක් කුලදරුවන් - ගිහි දිවි අත්හැර
උතුම් පැවිදි බව - ලැබගන්නේ

12. හෙළ කතුනට මෙහි - මෙහෙණන් වන්නට
ඕනෑ බව දැන් - පවසන්නේ
අපගෙ මිහිඳු හිමි - දඹදිව සිටිනා
සඟමිත් තෙරණිය - කැඳවන්නේ

13. සිරිමා බෝ හිමි - දකුණත් ශාඛා
සමගින් එතුමිය - වැඩමන්නේ
උතුම් පැවිදි බව - කතුනට ලැබදී
මෙහෙණ පිරිවරත් - ඇතිවන්නේ

14. සම්මා සම්බුදු - මුනි ධාතුන් මෙහි
වැඩමවමින් සෙත - සලසන්නේ
ථූපාරාමය - සෑ බඳවන්නේ
පින් ගංගාවකි - උපදින්නේ

15. හෙළ කුලදරුවන් - පැවිදි ව සැදැහෙන්
තුන් පිටකය අටුවා - සමගින්නේ
වණපොත් කරමින් - පිළිවෙත් පුරමින්
නිවන් මගෙහි නිති - හැසිරෙන්නේ

16. අපගෙ මිහිඳු හිමි - උපදෙස් දීමෙන්
මගඵල නිවනත් - ලැබගන්නේ
ගෞතම සසුනත් - මෙහි බබළන්නේ
ලක්දිව රහතුන් - බිහිවන්නේ

17. පන්දහසක් කල් - සසුන රකින්නට
අපගෙ මිහිඳු හිමි - කැපවෙන්නේ
ජීවමාන බුදු - කෙනෙකුන් කල මෙන්
බුදු සසුන ද මෙහි - බබළන්නේ

18. අපගෙ මිහිඳු හිමි - වියපත් වෙනවා
අසූ වියත් දැන් - එළැඹෙනවා
වප් පුර අටවක් - පොහොදිනයේදී
පිරිනිවනින් - නිවිලා යනවා

19. මිහිඳු ධාතු ගෙන - මේ සෑය බඳින්නේ
නෙත් සිත් අපගේ - සැනසෙන්නේ
සම්බුදු හිමිගේ - මහචේතිය අසලින්
මිහිඳු චේතියත් - බබළන්නේ

20. මිස්සක පව්වේ - මේ කඳු මුදුනේ
සඳ මඬලක් සේ - මහසෑය දිලේ
මහසෑ අසල ම - පහන් තරුව සේ
මිහිඳු හිමිගෙ මේ - සෑය දිලේ

21. කිරි සුදු පාටින් - සෑ බබළන්ටයි
අපගේ ගුරුදෙවි - පුද දෙන්ටයි
කළගුණ සලකා - පින් කරගන්ටයි
සාදු සාදු සෑ - නමදින්ටයි

22. බබළන පහනින් - මල් මාලාවෙන්
නිල් මල් කලසින් - කංචුකයෙන්
ධජ මාලාවෙන් - හමනා සුවඳින්
මිහිඳු සෑය අපි - පුද දෙන්ටයි

23. දෙඅත් මුදුන් දී - මිහිඳු තෙරුන් ගුණ
හඬනගමින් මෙහි - පවසන්ටයි
සාදු සාදු මේ - අපගේ ගුරුදෙවි
මිහිඳු සෑ රදුන් - නමදින්ටයි

**සාදු! සාදු!! සාදු!!!**